| | | | |
|---|---|---|---|
| දුරකථන<br>தொலைபேசி<br>Telephones | 011-2136600<br>011-2136650 | මගේ අංකය<br>எனது இல.<br>My No. | PSC/APL/3/AT/ Statistician/2026 |
| ලේකම්<br>செயலாளர்<br>Secretary | 011-2136602 | | |
| ෆැක්ස්<br>தொலைநகல்<br>Fax | 011-2876169<br>011-2876181 | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | |
| විද්‍යුත් තැපැල<br>மின் - அஞ்சல்<br>E - mail | info@psc.gov.lk | | |
| වෙබ් අඩවිය<br>இணையத்தளம்<br>Website | www.psc.gov.lk | දිනය<br>திகதி<br>Date | 2026.03. 17 |

රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
பகிரங்க சேவை ஆணைக்குழு அலுவலகம்
OFFICE OF THE PUBLIC SERVICE COMMISSION

අංක 1200/9, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.
இல. 1200/9, இராஜமல்வத்தை வீதி, பத்தரமுல்லை.
No. 1200/9, Rajamalwatta Road, Battaramulla.


**ලේකම්**
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

**2026 වාර්ෂික ස්ථාන මාරු නියෝග සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති අභියාචනාවලට අදාළ තීරණ දැනුම් දීම**

**සංඛ්‍යාලේඛනඥ සේවය**
**ශ්‍රී ලංකා තක්සේරු සේවයේ සහකාර තක්සේරුකරු**

උක්ත කරුණ සම්බන්ධයෙන් වන ඔබගේ අංක MF1/01/19/DCS/EST-19 හා 2026.02.19 දිනැති ලිපිය හා ඔබගේ අංක MF1/02/18/VAL/30 හා 2026.02.10 දිනැති ලිපිය බැදේ.

02. ඉහත සඳහන් සේවාවන්හි නිලධරයන් සම්බන්ධයෙන් ඔබ විසින් අනුමත කරන ලද 2026 වාර්ෂික ස්ථාන මාරු නියෝගවලට එරෙහිව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද අභියාචනාවලට අදාළව එම කොමිෂන් සභාව විසින් ලබා දී ඇති තීරණ මේ සමඟ ඔබ වෙත එවමි.

03. එක් එක් නිලධාරියා සම්බන්ධයෙන් වන රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණ වෙන වෙනම දන්වා යැවීමට කටයුතු කරනු නොලැබේ. ඒ අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභා වෙබ් අඩවියේ ස්ථාන මාරු අභියාචනයන්ට අදාළ නියෝග ප්‍රසිද්ධ කිරීමට අවශ්‍ය පියවර ගනු ලබන අතර මේ සම්බන්ධයෙන් 2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනතේ 2(ඇ) සහ (ඈ), 3 සහ 4 යන වගන්ති කෙරෙහි ඔබගේ අවධානය යොමු කරනු ලැබේ.

04. අදාළ නිලධාරීන් රාජ්‍ය සේවා කොමිෂන් සභා තීරණය සම්බන්ධයෙන් අතෘප්තියට පත්වන්නේ නම් 2002 අංක 04 දරන පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය පනතේ විධිවිධානවලට අනුකූලව පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය වෙත අභියාචනා ඉදිරිපත් කිරීමට හිමිකම් ඇත්තේ ය. එසේ වුවද, ඉදිරිපත් කරනු ලබන අභියාචනා සඳහා පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරයේ අවසන් තීරණයක් ලැබෙන තෙක් ලබා දී ඇති ස්ථාන මාරු නියෝගය එලෙසම ක්‍රියාත්මක විය යුතු බව ද කාරුණිකව දැනුම් දෙමි.

05. එසේම සංඛ්‍යාලේඛනඥ සේවයේ සහ ශ්‍රී ලංකා තක්සේරු සේවයේ සහකාර තක්සේරුකරු නිලධාරීන්ගේ 2026 වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධයෙන් වන ඉල්ලීම් හා ඒ සම්බන්ධයෙන් වන නිර්දේශ තවදුරටත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් නොකරන ලෙස ද වැඩිදුරටත් කාරුණිකව දන්වා සිටිමි.

**ඩබ්ලිව්.එච්.එම්.එම්.සී.කේ. දයාරත්න**
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව

පිටපත්
01. අධ්‍යක්ෂ ජනරාල්, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව - කරු.දැ.ගැ.ස. හා අ.ක.ස.
02. රජයේ ප්‍රධාන තක්සේරුකරු - කරු.දැ.ගැ.ස. හා අ.ක.ස.